සාමාන්‍ය සමය දෙවන ඉරුදින | **දේව ප්‍රකාශන** | 18-01-15

## පළමුවන දේව ප්‍රකාශනය

1සාමුවෙල් 3:3-10, 19-21

සාමුවෙල් දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**(සමිඳාණන් වහන්ස කතා කළ මැනව. ඔබේ දාසයා සවන් දී සිටී.)**

සාමුවෙල් ද දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව තිබුණු සමිඳාණන් වහන්සේගේ ශුද්ධස්ථානයෙහි නිදාගෙන සිටියේ ය. එහි පහන දල්වෙමින් තිබුණේ ය. එවිට සමිඳාණන් වහන්සේ සාමුවෙල්ට අඬගැසූ සේක. ඔහු ද, "මම මෙහි ය"යි කීය. එසේ කියා, ඔහු ඒලී ළඟට දිව ගොස් "ඔබ මට අඬගැසූවෙහි ය. මම මෙහි ය"යි කීවේ ය. ඒලී ද, "මම අඬනොගැසීමි; නැවතත් නිදාගන්නැ"යි කීවේ ය. ඔහු ගොස් නිදාගත්තේ ය. සමිඳාණන් වහන්සේ නැවතත්, "සාමුවෙල්" කියා අඬගැසූ සේක. සාමුවෙල් නැඟිට ඒලී ළඟට ගොස් "ඇත්තටම ඔබ මට අඬගැසුවෙහි ය; මෙන්න මම මෙහි ය"යි කී ය. එහෙත්, ඒලී පිළිතුරු දෙමින්, "මාගේ පුත්‍රය, මම අඬ නොගැසීමි, නැවතත් නිදාගන්නැ"යි කීවේ ය. සාමුවෙල් ඒ වන තුරු සමිඳාණන් වහන්සේ දැන සිටියේ නැත. ඒ වන තුරු සමිඳාණන් වහන්සේගේ වචන ඔහුට එළිදරව් නොවී ය. සමිඳාණන් වහන්සේ යළිත් තුන්වන වරටත්, සාමුවෙල්ට අඬගැසූ සේක. ඔහු නැඟිට ඒලී ළඟට ගොස්, "ඔබ මට කතා කෙළෙහි ය, මෙන්න, මම මෙහි ය"යි කී ය. එවිට, සමිඳාණන් වහන්සේ ළමයාට අඬගසන බව ඒලී තේරුම් ගත්තේය. එබැවින් ඒලී සාමුවෙල්ට කතා කොට, "ඔබ ගෙස් නිදාගන්න. ඔබට නැවත අඬගැසුවොත්, 'සමිඳාණන් වහන්ස කතා කළ මැනව; ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටී ය'යි කියන්නැ"යි කීවේ ය. සාමුවෙල් ගොස් තමාගේ යහනේ නිදාගත්තේ ය. එවිට සමිඳාණන් වහන්සේ වැඩම කර, පළමු වතාවල දී මෙන්, "සාමුවෙල්, සාමුවෙල්," කියා අඬගැසූ සේක. සාමුවෙල් පිළිතුරු දෙමින්, "කතා කළ මැනව; ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටී" යයි කීවේ ය. සාමුවෙල් වැඩුණේය. සමිඳාණන් වහන්සේ ඔහු සමඟ සිට ඔහු කී හැම දෙයක්ම එකක් වත් නැර ඉෂ්ට කළ සේක. සාමුවෙල් සමිඳාණන් වහන්සේගේ දිවැසිවරයෙකු වශයෙන් ස්ථිර කරන ලද බව, උතුරේ සිට දකුණ දක්වා සිටි සියලු ඉශ්‍රායෙල්වරු දැන ගත්තෝ ය. සමිඳාණන් වහන්සේ ෂිලෝහි දී සාමුවෙල් ට ප්‍රකාශ වූ සේක. එහි දී නැවත නැවත ප්‍රකාශ වී ඔහු සමඟ කතා කළ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 40:1,3,6-9

ඔබගේ පිළිතුර: මාගේ දෙවියනී, ඔබේ කැමැත්තට මම ප්‍රිය කරමි.

ගීය: මම ඉවසිල්ලෙන් හිමි තුමන් ගැන බලාපොරොත්තුවෙන් සිටියෙමි. හිමි තුමාණෝ මාගේ දුක් ගැනවිලි වලට සවන් දුන් සේක. දෙවිඳුන් හට තුති පවසන නව ගීයක් මා මුවේ තැබූ සේක. මෙය දැක බොහෝ දෙනෙකු ගරු බියෙන් ඇලළී සමිඳුන් කෙරෙහි අදහනු ඇත.

ඔබ පුද පඬුරට ප්‍රසන්න නැත. දවන යාග පූජා හා පාප පූජාවලින් ඔබට වැඩක් නැත. ඒ වෙනුවට ඔබ වදන් අසන පිණිස මාගේ දෙසවන දුන් සේක. එවිට මම, "මෙන්න, මම මෙහි ය"යි කීවෙමි. මා පිළිබඳ අණ පණත් ඔබේ ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත.

මාගේ දෙවියනි, ඔබේ කැමැත්තට ප්‍රිය වෙමි. ඔබේ නීති මසිතෙහි නිදන් කරගතිමි. සමිඳුනි, ඔබට වඳින පිරිස් මැද, ඔබේ ගැළවීමේ ක්‍රියා වර්ණනා කළෙමි. නොනවත්වා එය තවත් වර්ණනා කරන බව ඔබ දන්න සේක.

## දෙවන දේව ප්‍රකාශනය

1කොරින්ති 6:13-15,17-20

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**("ඔබගේ ශරීර ක්‍රිස්තුන් වහන්සේගේ අවයවයන් බව නොදන්නහු ද?")**

"ආහාර උදරය සඳහා ය, උදරය ආහාර සඳහා ය"යි කීවත් දෙවියන් වහන්සේ ඒ දෙක ම නැති කරන සේක. තවද ශරීරය අනාචාරය පිණිස නොවේ. එය සමිඳාණන් වහන්සේ උදෙසා ය. දෙවියන් වහන්සේ සමිඳාණන් වහන්සේ මරණයෙන් උත්ථාන කළ සේක. ස්වකීය බලයෙන් අපත් උන් වහන්සේ එසේ උත්ථාන කරන සේක. ඔබගේ ශරීර ක්‍රිස්තුන් වහන්සේගේ අවයවයන් බව නොදන්නහු ද? එසේ නම් මම ක්‍රිස්තුන් වහන්සේගේ අවයවයන් පැහැර ගෙන ඒවා ගණිකාවකගේ අවයවයන් කරම් ද? එහෙත් සමිඳාණන් වහන්සේට සම්බන්ධ වන තැනැත්තේ උන් වහන්සේ සමඟ ඒකාත්මයක් වන්නේ ය. අනාචාරයෙන් පලා යන්න. අන් හැම පාපයක් ම මිනිසා කරන්නේ ශරීරයෙන් බැහැර ය. එහෙත් අනාචාරය කරන්නා තමාගේ ම ශරීරයට විරුද්ධ ව පව් කරයි. ඔබගේ ශරීරය, ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ, ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නහු ද? ඔබ ඔබට ම අයිති නැත. ඔබ මිලයකට ගත් අය වන්නහු ය. එබැවින් ඔබගේ ශරීර දේව මහිමය සඳහා යොදවන්න.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

මතෙව් 11:25

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස, ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට, බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබට තුති පුදමි.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 1:35-42

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(ඔව්හු උන් වහන්සේ වැඩ වසන ස්ථානය දැක, එදින උන් වහන්සේ සමඟ නතර වූ හ.)**

පසු දින නැවතත් ජොහන් සිය ගෝලයන් දෙදෙනෙකු සමඟ සිටිය දී මඟ වඩිනා ජේසුස් වහන්සේ දෙස බලා, "බලන්න, දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ"යි කී ය. ගෝලයෝ දෙදෙන ඔහු කී දේ අසා ජේසුස් වහන්සේ පසුපස ගියහ. ජේසුස් වහන්සේ හැරී ඔවුන් තමන් පසුපස එනු දැක, "ඔබ කුමක් සොයන්නහු දැ"යි ඇසූ සේක. ඔව්හු ද, "රබ්බි, (එහි තේරුම ගුරුදේවයෙනි, යනු යි.) ඔබ වැඩ වසන්නේ කොතැන දැ"යි ඇසූ හ. "ඇවිත් බලන්නැ"යි උන් වහන්සේ ඔවුන්ට වදාළ සේක. එසේ ඔව්හු අවුත් උන් වහන්සේ වැඩ වසන ස්ථානය දැක, එදින උන් වහන්සේ සමඟ ගත කළහ. වේලාව සවස හතරට පමණ වී ය. ජොහන්ගේ කීම අසා උන් වහන්සේ පසුපස ගිය දෙදෙනාගෙන් එක් තැනැත්තෙක් නම්, සීමොන් පේදුරුගේ සොහොයුරු ඇන්ඩෘ ය. ඔහු පළමුවෙන් තම සොහොයුරා මුණගැසී, "අපට මෙසියස් වහන්සේ හමු වූ හ"යි කී ය. ('මෙසියස්' යන්නෙහි අර්ථය 'ක්‍රිස්තුස්' යනු යි.)

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.